# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 28 දරන
# ජාතික අධ්‍යාපන ආයතනය පනත

---

[සහතිකය සටහන් කළේ 1985 අගෝස්තු මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 අගෝස්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල: රු. 1.50 යි — තැපැල් ගාස්තුව: ශත 60 යි

[සහතිකය සටහන් කළේ 1985 අගෝස්තු මස 06 වන දින]

එල්. ඩී.—ඕ. 41/84

## ජාතික අධ්‍යාපන ආයතනයක් පිහිටුවීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

### I වන කොටස

### ජාතික අධ්‍යාපන ආයතනය පිහිටුවීම

**2.** (1) (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික අධ්‍යාපන ආයතනය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ආයතනයක් පිහිටුවනු ලැබේ. ජාතික අධ්‍යාපන ආයතනය පිහිටුවීම.

(2) ආයතනය, (1) වන උපවගන්තිය මගින් ඊට දෙන ලද නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් එය විසින් හා එයට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය.

**3.** අධ්‍යාපන සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ විශේෂයෙන් පහත දැක්වෙන පරමාර්ථ ආයතනයේ පරමාර්ථ විය යුතු ය:— ආයතනයේ අරමුණු.

(අ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා වූ සැලසුම්, වැඩ සටහන් සහ කටයුතු පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම ;

(ආ) විවිධ විශේෂිත අධ්‍යාපන විෂයයන්හි ලා පශ්චාත් උපාධි අධ්‍යාපනය සැලසීම හා එය ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) අධ්‍යාපන පද්ධතියෙහි කාර්ය සාධනය, අරමුණු, ව්‍යුහ, විෂය ප්‍රමාණය සහ විධි විද්‍යාව ද ඇතුළුව අධ්‍යාපන ක්‍රමය පිළිබඳව සහ අධ්‍යාපනයේ සමාජමය, ආර්ථික සහ වෙනත් අංශ පිළිබඳව අධ්‍යයනයන් පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) අධ්‍යාපනික කාර්ය සඳහා කාර්මික ඥානය අනුවර්තනය කිරීම ද ඇතුළුව අධ්‍යාපන පද්ධතියේ නවීකරණ ක්‍රියාවලියන් ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) අධ්‍යාපන පද්ධතියෙහි නියැලි කාර්ය මණ්ඩලයේ වෘත්තීය සහ කළමනාකරණමය නිපුණත්වය වැඩි දියුණු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඊ) ආණ්ඩුවට සහ වෙනත් අනුමත සංවිධානවලට අධ්‍යාපනය පිළිබඳ විශේෂඥ සේවා ලබාදීම ;

(ඩ)' අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අධ්‍යාපන සංවර්ධන වැඩ සටහන් කරගෙන යාම; සහ

(ඪ)' සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණය වීම.

ආයතනයේ බලතල.

4. පහත දැක්වෙන බලතල ආයතනයට තිබිය යුතු ය:—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම සහ දැරීම සහ එය විකිණීම, බද්දට දීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම:

එසේ වුව ද, ආයතනයේ කිසිම නිශ්චල දේපළක් අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ලියවිල්ලකින් නොලබා විකුණනු නොලැබිය යුතු ය;

(ආ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම ගිණුම්, ඉතිරි කිරීමේ ගිණුම් සහ තැන්පත් ගිණුම් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම;

(ඇ)' ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත පුද්ගලයින්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින් ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීම;

(ඈ) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමට හෝ එහි කාර්ය ඉටු කිරීමට අවශ්‍ය සියලු ගිවිසුම් ඇතිකර ගැනීම සහ ඉටු කිරීම;

(ඉ) [87 වන අධිකාරය වන] භාර ආඥාපනතේ 20 වන වගන්තියේ විධිවිධාන හෝ වෙන යම් ලිඛිත නීතියක් යටතේ භාර මුදල් ආයෝජනය කිරීම නීත්‍යනුකූල වන යම් සුරැකුමක යම් නොයෙදූ ආදායමක් ද ඇතුළුව ආයතනයට අයත් යම් මුදල් ආයෝජනය කිරීම හෝ එවැනි යම් මුදලක් ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළක් මිලට ගැනීම සඳහා ආයෝජනය කිරීම හෝ එවැනි ආයෝජන වෙනස් කිරීම හෝ ක්ෂණික වියදම් සඳහා අවශ්‍ය නොවන, ඒ මුදලේ යම් කොටසක් යම් බැංකුවක ස්ථිර තැන්පතුවක තැබීම;

(ඊ) අධ්‍යාපන සංවර්ධනයේ යම් අංශයකට අදාළ පර්යේෂණ, සමීක්ෂණ සහ විමර්ශන ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම, පවත්වාගෙන යාම හා සම්බන්ධීකරණය කිරීම;

(උ) ගුරුවරුන් සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලි වෙනත් කාර්ය මණ්ඩලය සඳහා අභ්‍යාස පාඨමාලා සහ ඉගැන්වීම් වැඩ සටහන් පවත්වාගෙන යාම සහ එවැනි පාඨමාලා සහ වැඩ සටහන් සාර්ථක ලෙස සම්පූර්ණ කරනු ලැබුවා වූ සහ නියමිත විභාග සමත් වූ තැනැත්තන්ට උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම;

(ඌ) අධ්‍යාපනයට අදාළ, නිශ්චිත පර්යේෂණ ව්‍යාපෘතියක් හෝ ව්‍යාපෘති සඳහා යම් තැනැත්තකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට හෝ යම් පිළිගත් ආයතනයකට හෝ ආයතනවලට ප්‍රදාන දීම;

(එ) අධ්‍යයන හා පුහුණු කටයුතු සඳහා මධ්‍යස්ථාන පිහිටුවීම, සජ්ජිත කිරීම සහ නඩත්තු කිරීම;

(ඒ) ආයතනයේ කාර්ය සඳහා පුස්තකාල සහ විද්‍යාගාර ඉදි කිරීම, සජ්ජිත කිරීම හා නඩත්තු කිරීම සහ අධ්‍යාපනික පර්යේෂණ හා අධ්‍යයන සඳහා අවශ්‍ය වෙනත් සේවාවන් සැලසීම ;

(ඔ) කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයින් හුවමාරු කර ගැනීම සඳහා සහ සාමාන්‍ය වශයෙන් ස්වකීය පොදු පරමාර්ථවලට හිත කර යම් කාර්ය සඳහා, ආයතනයේ අරමුණුවලට සම්පූර්ණ වශයෙන් හෝ අඩ වශයෙන් සමාන අරමුණු ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශයක අධ්‍යාපනික හෝ වෙනත් ආයතන සමග සහයෝගිතා ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(ඕ) ආයතනය විසින් කරනු ලැබූ යම් සේවා සඳහා ගාස්තු හෝ අයකිරීම් නියම කිරීම ;

(ක) ආයතනයේ කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ; සහ

(ග) ආයතනයේ මතය අනුව, ආයතනයේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍යවන හෝ හිතකරවන හෝ ආනුෂංගික වන වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම.

5. 4 වන වගන්තියෙන් ආයතනය වෙත පැවරුණු බලතලවල සාමාන්‍යත්වයට හානියක් නොමැතිව, ආයතනය විසින්, පහත දැක්වෙන ශාස්ත්‍රීය බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය ; ඉටු කරනු ලැබිය යුතු ය :— ආයතනයේ ශාස්ත්‍රීය බලතල.

(අ) (i) මේ පනත යටතේ ඉගැන්වීමේ සුදුසුකම් වශයෙන් පිළිගෙන ඇති, ආයතනයේ උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම හා සම්බන්ධ විභාග සහ වෙනත් කොන්දේසි රීති මගින් නියම කිරීම ;

(ii) (i) වන අනුඡේදයේ සඳහන් විභාග සඳහා අනුබද්ධ විද්‍යායතනවල ශිෂ්‍යයන් හා ගුරුවරුන් ලියාපදිංචි කිරීම ;

(iii) (i) වන අනුඡේදයේ සඳහන් උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම පිණිස රීති මගින් නියමිත ප්‍රමිතිවලට එළඹුණු තැනැත්තන් නිශ්චය වශයෙන් දැන ගැනීමේ කාර්යය සඳහා 10(3) වගන්තියේ විධිවිධානවලට යටත්ව විභාග පැවැත්වීම ;

(ආ) (i) විවිධ විශේෂිත අධ්‍යාපන විෂයයන්හි ලා පශ්චාත් උපාධි උපදේශ, පුහුණුව සහ පර්යේෂණ සඳහා කටයුතු සැලසීම ;

(ii) ආයතනයේ පශ්චාත් උපාධි, ඩිප්ලෝමා හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම හා සම්බන්ධ විභාග සහ කොන්දේසි රීති මගින් නියම කිරීම ;

(iii) (ii) වන අනුඡේදයෙහි සඳහන් පශ්චාත් උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම හා සම්බන්ධ අධ්‍යයන පාඨමාලා හෝ වැඩ සටහන් හැදෑරීම සඳහා අධ්‍යාපන පද්ධතියෙහි නියැලි කාර්ය මණ්ඩලය ලියාපදිංචි කිරීම ;

(iv) (ii) වන ඡේදයෙහි සඳහන් පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම පිණිස රීති මගින් නියමිත ප්‍රමිතිවලට එළඹුණු තැනැත්තන් නිශ්චය වශයෙන් දැනගැනීමේ කාර්යය සඳහා 10(3) වගන්තියේ විධිවිධානවලට යටත්ව, විභාග පැවැත්වීම ;

(ඇ) ආයතනයේ විභාග සමත් වූ ද රීති මගින් නියමිත වෙනත් කොන්දේසි සපුරා ලූ ද තැනැත්තන්ට සහ තැනැත්තන් වෙත උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සහ පිරිනැමීම ;

(ඈ) ආයතනයට ඇතුළත් වීමට බලාපොරොත්තු වන්නා වූ තැනැත්තන් විසින් හෝ ආයතනයේ ශිෂ්‍යයන් විසින් විශ්ව විද්‍යාල හෝ අධ්‍යයන ස්ථානවල දී සමත් වූ විභාග සහ හදාරනු ලැබූ අධ්‍යයනය හෝ අධ්‍යයන කාලසීමාවන්, ඒ විශ්ව විද්‍යාලවල දී හෝ අධ්‍යයන ස්ථානවල දී සමත් වූ ඒ විභාග සහ හැදෑරූ අධ්‍යයන පාඨමාලා කාලසීමාව සැලකිල්ලට ගනිමින් පිළිගැනීම සහ ඒ පිළිගැනීම කවර වූ හෝ විටක දී හෝ ඒ කරුණුම සැලකිල්ලට ගනිමින් ඉල්ලා අස්කර ගැනීම ;

(ඉ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය මහාචාර්ය තනතුරු සහ වෙනත් ශාස්ත්‍රීය තනතුරු ඇති කිරීම ;

(ඊ) ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග ඇතිකර, ප්‍රදානය කිරීම ; සහ

(උ) අධ්‍යාපනික විද්‍යායතන සහ සමාන ගුරු අධ්‍යාපනික ආයතන අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව අනුබද්ධ විද්‍යායතන වශයෙන් ලියාපදිංචි කිරීම සහ එවැනි ලියාපදිංචි කිරීම් සඳහා වූ කොන්දේසි රීති මගින් නියම කිරීම.

ආයතනයේ පරිපාලනය සභාව වෙත පවරනු ලැබිය යුතු බව.

6. (1) ආයතනයේ කටයුතු පරිපාලනය, කළමනාකරණය සහ පාලනය (මෙහි මින් මතු "සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) ආයතනයේ සභාව වෙත පවරනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා සභාව විසින්, මේ පනතින් ආයතනය වෙත හෝ ආයතනයට

(3) සාදන ලද නියෝග ප්‍රකාර, තුන් අවුරුදු වැඩ සැලැස්මක්, වාර්ෂික සැලැස්ම හා වැඩ සටහන සහ වාර්ෂික අයවැය පිළියෙල කිරීම සභාවේ කාර්යය විය යුතු අතර, ඒ සැලසුම් සහ වැඩ සටහන් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබීම සඳහා ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

7. (1) සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :— සභාව සංස්ථාපනය කිරීම.

(අ) නිල බලයෙන් සාමාජිකයන් වන තැනැත්තන්, එනම්—

(i) (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සභාපතිවරයා විය යුතු අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ;

(ii) ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ; සහ

(ආ) පහත සඳහන් වෙනත් සාමාජිකයන්, එනම්—

(i) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, උසස් අධ්‍යාපනය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(ii) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන මුදල් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ; සහ

(iii) අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි පළපුරුද්ද ඇති තැනැත්තන් අතුරෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් තැනැත්තන් අට දෙනෙක්.

(2) යම් තැනැත්තකු, තමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නම් හෝ එසේ පත් වන්නේ නම් හෝ ඔහු සභාවේ සාමාජිකයකු වශයෙන් පත්වීමට හෝ එසේ කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු වන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලබන සභාවේ සෑම සාමාජිකයකු ම—

(අ) අමාත්‍යවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුව හොත් ; හෝ

(ආ) අමාත්‍යවරයා අමතන ලද ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඔහු ඉල්ලා අස්වුවහොත්

එවැනි සාමාජිකයකු වශයෙන් ධුරය අත්හළ යුතු ය.

(4) (අ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද සභාවේ සාමාජිකයකු මියයන හෝ ඉල්ලා අස්වන හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන අවස්ථාවක, මියයන, ඉල්ලා අස්වන හෝ ධුර යෙන් ඉවත් කරනු ලබන සාමාජිකයා වෙනුවට, වෙනත් තැනැත්තකු සාමාජිකයකු වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සභාවේ යම් සාමාජිකයකු ස්වකීය ධුරයෙන් කලින් ඉල්ලා අස්වුව හොත් හෝ මියයාම හෝ ඉවත් කිරීම නිසා ධුරය අත්හැරියහොත් මිස, තමා අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ධුර කාලයේ ඉකුත් නොවූ කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(5) රෝගාතුරවීම හෝ වෙනත් අබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ නිසා, (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද සභාවේ සාමාජිකයකුට ස්වකීය ධුරයේ කාර්ය කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(6) (9) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද සෑම සාමාජිකයකුම, මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය අත්හරිනු ලැබුවහොත් මිස, තමා ඒ ධුරයට පත් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු හතරක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය.

(7) සභාවේ නිල බලයෙන් පත්වන සෑම සාමාජිකයකුම, තමා සභාවේ සාමාජිකයකු වූයේ යම් තනතුරක් ප්‍රකාර ද ඒ තනතුර දරන තාක් කල් ධුරය දැරිය යුතු ය.

(8) (1) වන උපවගන්තියේ (ආ) (iii) ඡේදය යටතේ පත් කරන ලද සභාවේ සාමාජිකයන් අතුරෙන් හරි අඩක් සෑම දෙවන වර්ෂයේ දී ම විශ්‍රාම යා යුතු ය.

(9) (1) වන උපවගන්තියේ (ආ) (iii) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයන් අතුරෙන් හරි අඩක් සෑම දෙවන වර්ෂයේ දී ම විශ්‍රාම යාම පුරුකීමේ කාර්ය සඳහා, අමාත්‍යවරයා විසින් එසේ නිශ්චිතව සඳහන් කර ප්‍රථමයෙන් සභාවට පත් කරන ලද සාමාජිකයන් හතර දෙනකුගේ ධුර කාලය, පත්වීමේ දින සිට අවුරුදු දෙකක කාල සීමාවක් ඉකුත්වීමෙන් පසු අවසන් කරනු ලැබිය යුතු ය.

(10) (3) වන උපවගන්තිය යටතේ ඉවත් කරනු ලැබීම හැර අන්‍යාකාරයකින් ස්වකීය ධුරය අත් හරින යම් සාමාජිකයෙක් නැවත පත් කිරීම සඳහා සුදුසුකම් විය යුතු ය.

(11) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චිත කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් සභාවේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

ආයතනයේ මුද්‍රාව.

8. ආයතනයේ මුද්‍රාව —

(අ) සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තන් භාරයේ තිබිය යුතු ය;

(ආ) සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය; තවද

(ඇ) සභාවේ අනුමතය ඇතිව මිස සහ තමා පැමිණ සිටිය බවට සළකුණක් වශයෙන් යම් ලියවිල්ලකට අත්සන් තැබිය යුතු සභාවේ සාමාජිකයකු ඉදිරියේ දී හැර, ඒ ලියවිල්ලේ මත නොතැබිය යුතු ය.

9. (1) සභාපතිවරයා හෝ ඔහු නොපැමිණි විටක දී ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සභාවේ රැස්වීම්වල මූලසුන දැරිය යුතු ය. සභාපතිවරයා හා අධ්‍යක්ෂ ජනරාල්වරයා යන දෙදෙනාම නොපැමිණි විටක දී පැමිණි සාමාජිකයන් විසින් තෝරාගනු ලබන සාමාජිකයකු ඒ රැස්වීම්වල මූලසුන දැරිය යුතු ය. සභාවේ රැස්වීම්.

(2) යම් රැස්වීමක ගණපූරණය සභාවේ සාමාජිකයන් හතර දෙනකුට නො අඩු විය යුතු ය.

(3) සභාවේ යම් රැස්වීමක තීරණ ගත යුතු සියලු ප්‍රශ්න පැමිණි සාමාජිකයන්ගේ බහුතරයක ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමතාවක දී, සභාපතිවරයාට හෝ සභාවේ යම් රැස්වීමක මූලසුන දරන වෙන යම් සාමාජිකයකුට, තමාගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සභාව විසින්, සභාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු පිළිබඳව, එහි කාර්ය පරිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

(5) සාමාජිකත්වයෙහි යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන්ම පමණක් හෝ එහි සාමාජිකයකු පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන්ම පමණක් හෝ සභාවේ කිසිම ක්‍රියාවක් හෝ තීරණයක් හෝ කටයුත්තක් බල රහිත නොවිය යුතු ය.

10. (1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයක් තිබිය යුතු ය. ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය.

(2) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය, ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධයෙන් වගකිව යුතු ය.

(3) සාදන ලද රීතිවලට අනුකූලව ආයතනය විසින් පවත්වනු ලබන විභාග පැවැත්වීම සම්බන්ධයෙන් මණ්ඩලය වගකිවයුතු අතර, නියමිත විභාග සමත්වී, වෙනත් නියමිත කොන්දේසි සපුරාලූ, ආයතනයේ උපාධි, ඩිප්ලෝමා සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලැබූ තැනැත්තන් සභාවට නිර්දේශ කළ යුතු ය.

(4) (3) වන උපවගන්තියෙන් මණ්ඩලය වෙත පැවරුණු බලතලවල සාමාන්‍යාන්වයට හානියක් නොමැතිව, මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කළ යුතු ය; ඉටු කරනු ලැබිය යුතු ය:—

(අ) සියලු ශාස්ත්‍රීය කරුණු සම්බන්ධයෙන් සභාවට උපදෙස් දීම;

(ආ) සභාව විසින් මණ්ඩලය වෙත යොමු කරනු ලබන කවර කරුණක් පිළිබඳව හෝ සලකා බලා වාර්තා කිරීම;

(ඇ) ආයතනය විසින් කරගෙන යනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීමේ වැඩ සටහන හෝ වැඩ සටහන් සහ විභාග හා සම්බන්ධ කරුණු පිළිබඳව සභාවට නිර්දේශ සහ වාර්තා කිරීම;

(ඈ) ආයතනය විසින් කරගෙන යනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන අධ්‍යයන පාඨමාලාවලට, ඉගැන්වීමේ වැඩ සටහනට හෝ වැඩ සටහන්වලට සහ විභාගවලට ශිෂ්‍යයන් ඇතුළත් කිරීම සඳහා පැනවිය යුතු නියමයන් සභාවට නිර්දේශ කිරීම ;

(ඉ) ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලාවලට, ඉගැන්වීමේ වැඩ සටහනට හෝ වැඩ සටහන්වලට සහ විභාගවලට අදාළ රීති කෙටුම්පත් කිරීම සහ ඒ කෙටුම්පත් සභාවට ඉදිරිපත් කිරීම ;

(ඊ) ආයතනය විසින් පවත්වනු ලබන විභාගවල දී පරීක්ෂකයන් වශයෙන් පත් කිරීම සඳහා සුදුසු තැනැත්තන්ගේ නම් සභාවට නිර්දේශ කිරීම ;

(උ) මහාචාර්ය තනතුරු හා වෙනත් ශාස්ත්‍රීය ශ්‍රේණි ඇති කිරීම, අහෝසි කිරීම හෝ අත්හිටුවීම සම්බන්ධයෙන් සභාවට නිර්දේශ කිරීම ;

(ඌ) ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා වූ කොන්දේසි සභාවට නිර්දේශ කිරීම ;

(එ) යම් ශිෂ්‍යත්ව, පදක්කම් සහ ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා සභාව විසින් අනුමත කරන ලද කොන්දේසි සපුරාලූ යම් තැනැත්තන්ට අනු ශිෂ්‍යත්ව සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් සභාවට නිර්දේශ කිරීම ; සහ

(ඒ) මණ්ඩලයේ සාමාජිකයන් නොවන තැනැත්තන් ඇතුළත් වන කමිටු, සභාවේ අවසරය ඇතිව, පත් කිරීම.

(5) (3) වන හෝ (4) වන උපවගන්තිවල සඳහන් යම් කාරණයකට අදාළ කිසිම තීරණයක්, ඒ කාරණය පිළිබඳව ස්වකීය නිර්දේශ සටහන් කිරීමේ සහ සභාව වෙත සම්ප්‍රේෂණය කිරීමේ අවස්ථාව මණ්ඩලයට සලසා දුනහොත් මිස, සභාව විසින් හෝ ඒ කාරණයට අදාළ යම් බලතලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් තමා වෙත පවරනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ කරනු නොලැබිය යුතු ය. එබඳු යම් කාරණයක් පිළිබඳ සභාවේ හෝ ඒ නිලධරයාගේ තීරණය මණ්ඩලයේ නිර්දේශයට පටහැනි වන අවස්ථාවක, මණ්ඩලයේ නිර්දේශ අනුගමනය නොකිරීම සම්බන්ධයෙන් ස්වකීය හේතු සභාව විසින් හෝ ඒ නිලධරයා විසින් සටහන් කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

## ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සහ ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම

ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් පත් කිරීම.

**11.** (1) ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු වූ ද ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා විය යුතු වූ ද (මෙහි මින්මතු "අධ්‍යක්ෂ ජනරාල්" යනුවෙන් හඳුන්වනු ලබන) අධ්‍යක්ෂ ජනරාල්වරයකු, අමාත්‍යවරයා විසින් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල් මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය අත්හරින්නේ නම් මිස, තමාගේ පත්වීමේ දින සිට අවුරුදු හතරක කාල සීමාවක් සඳහා ධුරය දැරිය යුතු ය.

(3) සභාවේ පොදු විධානයට යටත්ව, ආයතනයේ කටයුතු පරිපාලනය සහ ආයතනයේ කාර්ය මණ්ඩලය පාලනය අධ්‍යක්ෂ ජනරාල් භාරයේ පැවතිය යුතු ය. සභාවේ සියලුම තීරණ ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් ද ඔහු වගකිව යුතු ය.

(4) ආයතනයේ අරමුණු ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි තමා විසින් සලකනු ලබන ප්‍රතිපත්ති සහ ක්‍රියා මාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සභාවේ සැලකිල්ල සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) සභාව විසින් තමා වෙත පවරනු ලබන යම් බලතල හෝ කාර්ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය; නැතහොත් ඉටු කරනු ලැබිය යුතු ය.

(6) මේ පනතින් හෝ මේ පනත යටතේ පිහිටුවන ලද යම් මණ්ඩලයක හෝ වෙනත් එවැනි මණ්ඩලයක යම් රැස්වීමක දී පැමිණ, කථා කිරීමට සහ ඡන්දය දීමට අධ්‍යක්ෂ ජනරාල්ට හිමිකම තිබිය යුතු ය.

(7) (අ) ස්වකීය කාර්ය ඉටු කිරීමට නොහැකි තත්ත්වයකට ස්ථිර වශයෙන්ම අධ්‍යක්ෂ ජනරාල් පත් වේතොත්; හෝ

(ආ) අමාත්‍යවරයාගේ මතය අනුව වංචනික හෝ නීති විරෝධී ස්වභාවයේ හෝ ආයතනයේ අරමුණුවලට හාත්පසින්ම පටහැනි ක්‍රියාවක් හෝ දෙයක් අධ්‍යක්ෂ ජනරාල් විසින් කරනු ලැබුවහොත්; හෝ

(ඇ) ජාතික ප්‍රතිපත්තියට පටහැනිව අධ්‍යක්ෂ ජනරාල් ක්‍රියා කළහොත්

අමාත්‍යවරයා විසින් ලියවිල්ලක් මගින් අධ්‍යක්ෂ ජනරාල් ඉවත් කරනු ලැබිය හැකි ය.

(8) අධ්‍යක්ෂ ජනරාල් ධුරය, ඒ ධුරය දරන්නා මිය ගිය විට, (7) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කළ විට හෝ ඒ ධුරය දරන්නා අමාත්‍යවරයා අමතන ලද ලිපියක් මගින් ඉල්ලා අස්වූ විට හෝ හිස් විය යුතු ය.

(9) (7) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවේ නම් මිස, අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත් කරනු ලැබූ යම් තැනැත්තකු අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් නැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(10) අධ්‍යක්ෂ ජනරාල් ධුරයේ පුරප්පාඩුවක් ඇති වූ විට, (1) වන උපවගන්තිය යටතේ පත්වීමක් කරන තුරු අධ්‍යක්ෂ ජනරාල් ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා අමාත්‍යවරයා විසින් සභාවේ සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(11) අධ්‍යක්ෂ ජනරාල් ආයතනයේ ගිණුම් නිලධාරියා විය යුතු ය.

(12) සභාව විසින් තමා වෙත පවරන ලද යම් බලතලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් යම් නිලධරයකුට හෝ වෙනත් සාමාජිකයකුට පැවරීම අවශ්‍ය යයි තමා සලකන කවර විටක දී වුව ද සභාවේ අනුමතය ඇතිව අධ්‍යක්ෂ ජනරාල් විසින් එසේ පවරනු ලැබිය හැකි ය.

ආයතනයේ කාර්ය මණ්ඩලය.

12. (1) මේ පනතේ විධිවිධානවලට සහ අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගවලට යටත්ව, ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීමට සභාවට බලතල ඇත්තේ ය.

(2) ආයතනයේ කාර්ය මණ්ඩලයට කරනු ලබන සෑම පත්වීමක්ම නියෝග මගින් නියමිත, පත්වීම් සඳහා වූ බඳවා ගැනීමේ පරිපාටියට සහ කාර්ය පරිපාටියට අනුකූලව සභාව විසින් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධානවලට සහ අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගවලට යටත්ව, වේතන, වැටුප් සහ වෙනත් පාරිශ්‍රමික ඇතුළුව ආයතනයේ කාර්ය මණ්ඩලයේ සේවා නියම සහ කොන්දේසි සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(4) ආයතනයේ කාර්ය මණ්ඩලය, සේවයෙන් පහ කිරීමේ බලය ද ඇතුළුව සභාවේ විනය පාලනයට යටත් විය යුතු ය. විනය කරුණු පිළිබඳව සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(5) සභාව විසින් ආයතනයේ කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා අර්ථ සාධක අරමුදල් සහ යෝජනා ක්‍රම පිහිටුවා, විධිමත් කරනු ලැබිය හැකි ය. තව ද, එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට සභාව විසින් දායක මුදල් ගෙවනු ලැබිය හැකි ය.

ඇතැම් ගිවිසුම්වල කාර්ය සඳහා ආයතනයේ සේවය ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සැලකිය යුතු බව.

13. යම් නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට ඇතුළත් වූ යම් තැනැත්තකු ආයතනය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ආයතනයට කරන ලද යම් සේවා කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම් නිදහස් කර ලීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

ආයතනයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

14. (1) සභාවේ ඉල්ලීම පිට, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ සේවය කරන රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟත්වය සමඟ වූ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්ගේ සහ ඒ නිලධරයාගේ කැමැත්ත ඇතිව, ආයතනය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාල සීමාවක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකි ය; නැතහොත්, එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලැබිය හැකි ය.

(2) සභාවේ ඉල්ලීම පිට, (1) වන උපවගන්තියේ සඳහන් නිලධරයකු නොවන රජයේ සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ

ලේකම්ගේ ද කැමැත්ත ඇතිව, ආයතනයේ කාර්ය මණ්ඩලයට එවැනිම කැමැත්ත ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැත හොත්, එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(3) ආයතනයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධර යකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13(2) වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) ආයතනයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධර යකු ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13(3) වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධ යෙන් අදාළ විය යුතු ය.

(5) සභාවේ ඉල්ලීම පිට, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද යම් උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත්, එවැනිම කැමැත්ත ඇතිව, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

සභාවේ බලතල අධ්‍යක්ෂ ජනරාල්ට, හෝ සභාවේ කමිටුවකට පැවරීම.

**15.** (1) සභාව විසින්, එහි බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් අධ්‍යක්ෂ ජනරාල්ට හෝ සභාවේ යම් කමිටුවකට පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලතලයක්, කාර්යයක්, හෝ කර්තව්‍යයක් තමා වෙත පවරා ඇති අධ්‍යක්ෂ ජනරාල් හෝ යම් කමිටුවක් විසින් ඒ බලතල, කාර්යය හෝ කර්තව්‍යය සභාවේ විධානවලට යටත්ව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. ඉටු කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

### මුදල්

ආයතනයේ ආරම්භක ප්‍රාග්ධනය.

**16.** (1) පාර්ලිමේන්තු යෝජනා සම්මතයකින් ආයතනය වෙත ප්‍රදානය කරනු ලබන යම් මුදල්, ආයතනයේ ආරම්භක ප්‍රාග්ධනය විය යුතු ය.

(2) ආයතනයේ ප්‍රාග්ධනය යම් විසර්ජන පනතකින් හෝ පාර්ලිමේන්තු යෝජනා සම්මතයකින් බලය දෙනු ලබන යම් මුදල් ප්‍රමාණ මගින් කලින් කල වැඩි කරනු ලැබිය හැකි ය.

ආයතනයේ අරමුදල.

**17.** (1) ආයතනයට ආයතනයේ අරමුදලක් තිබිය යුතු ය.

(2) (අ) ආයතනයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ආයතනය ලබන්නා වූ සියලු මුදල් ; සහ

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කවර වූ හෝ ප්‍රභවයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් ආයතනයට ලැබෙන සියලු මුදල් ආයතනයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (අ) මේ පනත යටතේ ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ආයතනය විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ; සහ

(ආ) මේ පනතින් හෝ මේ පනත යටතේ ඒ අරමුදලින් ගෙවීමට අවශ්‍ය සියලු මුදල්

ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ආයතනයේ මුදල් වර්ෂය.

**18.** ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

ගිණුම් විගණනය.

**19.** රාජ්‍ය සංස්ථාවක ගිණුම් විගණනය කිරීමට අදාළ, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාල විය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතේ ඇතැම් විධිවිධාන අදාළ විය යුතු බව.

**20.** අන්‍යාකාර විධිවිධාන මේ පනතින් විශේෂයෙන් සලස්වා ඇතොත් මිස, 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන ආයතනයේ මුදල් පාලනය හා ගිණුම්වලට සහ ඒවා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

## IV වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

සභාවට අදාළව අමාත්‍යවරයා සතු බලතල.

**21.** (1) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම (10 (3) හෝ 10 (4) වන වගන්තියෙහි සඳහන් යම් බලතල ක්‍රියාත්මක කිරීම හෝ යම් කාර්යයක් ඉටුකිරීම හැර) සම්බන්ධයෙන් වූ සාමාන්‍ය විධාන, අමාත්‍යවරයා විසින් කලින් කල සභාවට ලිඛිතව නිකුත් කළ හැකි අතර, සභාව විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ කටයුතු සියල්ල හෝ ඉන් කිසිවක් තමා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන තැනැත්තකු හෝ තැනැත්තන් විසින් විමර්ශනය කරනු ලැබ, ඒ පිළිබඳ වාර්තා කළ යුතු බවට අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි අතර, එවැනි නියමයක් කරනු ලැබූ විට, ඒ නියමය ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය සියලු පහසුකම් සැලසීම සහ සියලු තොරතුරු සැපයීම සභාව විසින් කරනු ලැබිය යුතු ය.

(3) ආයතනයේ යම් උපාධියක්, ඩිප්ලෝමාවක් හෝ වෙනත් ශාස්ත්‍රීය සුදුසුකමක් ප්‍රදානය කිරීම සඳහා නියමිත ප්‍රමිති සැලකිල්ලට ගනිමින්, ලිඛිත නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් ඒ උපාධි, ඩිප්ලෝමා හෝ වෙනත් සුදුසුකම් ඉගැන්වීමේ සුදුසුකමක් වශයෙන් පිළිගනු ලැබිය හැකි ය. ඒ කරුණුම සැලකිල්ලට භාජනය කරමින් අමාත්‍යවරයා විසින් මෙම උපවගන්තිය යටතේ කරන ලද පිළිගැනීමේ යම් නියමයක් අවලංගු කරනු ලැබිය හැකි ය.

(4) සභාව විසින් ඉදිරිපත් කරන ලද තුන් අවුරුදු වැඩ සැලැස්ම, වාර්ෂික සැලැස්ම, වැඩ සටහන් සහ වාර්ෂික අයවැය සංශෝධනය ඇතිව හෝ නැතිව අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි ය.

22. 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 128 වන වගන්තියේ විධිවිධාන, ආයතනයට සහ ආයතනය සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය. 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ ඇතැම් විධිවිධාන අදාළ නොවිය යුතු බව.

23. (1) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය වන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ යම් චංචල දේපළක් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ආයතනයට පවරනු ලැබිය හැකි ය. තවද, එසේ පවරනු ලැබූ යම් චංචල දේපළක් නියමයේ සඳහන් දින සිට ආයතනය සතු විය යුතු අතර, එය ආයතනයේ දේපළ විය යුතු ය. චංචල හා නිශ්චල යන දෙයාකාරයේම රජයේ දේපළක් ආයතනය වෙත ලබා දිය යුතු බව.

(2) යම් රජයේ ඉඩමක් හෝ යම් රජයේ ගොඩනැගිල්ලක්, තත් කාලයෙහි රජයේ ඉඩම් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන කොන්දේසිවලට යටත්ව, ආයතනයේ යම් නිලධරයකුගේ හෝ සේවකයකුගේ වාසස්ථානය වශයෙන් පරිහරණය කිරීම ද ඇතුළුව ආයතනයේ යම් කාර්යයක් සඳහා ආයතනයේ පරිහරණයට ලබාදීම හෝ ආයතනය සතු කිරීම කළ හැකි ය.

(3) ආයතනය වෙත කරනු ලබන සියලු ඉඩම් පැවරීම්, යම් බද්දකින් හෝ මුද්දර ගාස්තුවකින් නිදහස් විය යුතු ය.

24. ආයතනයේ එක් එක් මුදල් වර්ෂය පියවීමෙන් පසු, මාස හයක කාලසීමාවක් ඉකුත්වීමට පෙර, ඒ වර්ෂය තුළ ආයතනයේ කටයුතු පිළිබඳ සම්පූර්ණ විස්තරයක් දැක්වෙන වාර්තාවක්, සභාව විසින් අමාත්‍යවරයා වෙත යවනු ලැබිය යුතු ය. ඔහු විසින් එහි පිටපත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සලස්වනු ලැබිය යුතු ය. සභාව විසින් එහි කටයුතු පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බව.

25. ආයතනය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන එපරිද්දෙන් තේරුම් ගත යුතු ය. අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් වශයෙන් සැලකිය යුතු බව.

ආයතනයේ සාමාජිකයන් සහ සේවා නියුක්තයන් රාජ්‍ය සේවකයන් වශයෙන් සැලකිය යුතු බව.

26. ආයතනයේ සියලුම සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා රාජ්‍ය සේවකයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ කරනු ලැබූ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

27. (1) (අ) මේ පනත යටතේ ආයතනය විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ආයතනයට විරුද්ධව ද;

(ආ) මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත සභාවේ යම් සාමාජිකයකු ආයතනයේ නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව ද

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොපවරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් එවැනි යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත හෝ කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, එකී ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් යයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඔහු විසින් දරන ලද යම් වියදම් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුත්තේ ය.

නියෝග.

28. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් යම් කාරණයක් සඳහා සහ ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය :—

(අ) ආයතනයේ කාර්ය මණ්ඩලයේ පාරිශ්‍රමික ද ඇතුළු සේවා නියම හා කොන්දේසි;

(ආ) ආයතනයේ කාර්ය මණ්ඩලයට පත්කිරීම සඳහා වූ බඳවා ගැනීමේ පරිපාටිය සහ කාර්ය පරිපාටිය;

(ඇ) මණ්ඩලයේ සංයුතිය හා එහි කටයුතු පවත්වාගෙන යාම;

(ඈ) ආයතනයේ තුන් අවුරුදු වැඩ සැලැස්ම, වාර්ෂික සැලැස්ම හා වැඩ සටහන සහ වාර්ෂික අයවැය පිළිබඳ ආකෘතිය, ඒ වැඩ සැලැස්ම, වාර්ෂික සැලැස්ම හා වැඩ සටහන සහ අයවැය පිළියෙල කළ යුතු ආකාරය; සහ

(ඉ) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ සෑදිය යුතු යයි මේ පනතින් බලය දෙනු ලැබූ, නියෝග සෑදිය යුතු වෙනත් යම් කාරණා.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයේ සඳහන් යම් පසු දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු යම් පහසු දිනයක අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කරන ලද යම් දෙයකට හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කළ ලෙස සලකනු ලැබූ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.